# විදුර විදුහල - කොළඹ

## සිංහල භාෂාව- 3 ශ්‍රේණිය

## දෙවන වාරය - සිසු සටහන-13

## “යුගල පද ”

---

- ❖ පහත සඳහන් “යුගල පද ”පාඩමට අදාළ සිසු සටහන සිංහල ලිවීම පොතෙහි ලියා , දී ඇති අභ්‍යාස කරන්න.
- ❖ සිසු සටහන සිංහල ලිවීම පොතේ ලිවීමට පෙර පහත සඳහන් ඊට අදාල යූ ටියුබ් ලින්ක් එකට පිවිස “යුගල පද” පාඩම නරඹන්න.

https://www.youtube.com/watch?v=WC5ema3e6fs

### යුගල පද හඳුනා ගනිමු.

- ❖ යුගල යනු දෙකකි.එකවර පද දෙකක් යෙදීම යුගල පද ලෙස හැඳින්වේ.

- පහත සඳහන් ඡේදය හැකිනම් මුද්‍රිත පිටපතක් රැගෙන ලිවීම පොතේ අලවා ගන්න, එසේ නොහැකිනම් එම ඡේදය පොතේ පිටපත් කරගන්න .
- එම ඡේදයේ සඳහන් යුගල පද තෝරා පාට පැන්සලකින් එම පද කොටු කරන්න.

### හොඳ දරුවෝ

ඈත කඳුකර ප්‍රදේශයක තිබුණු සුන්දර ගමක පුංචි පවුලක් ජීවත් වුණා. අම්මා, තාත්තා , දූව සහ පුතා මේ පවුලේ සාමජිකයෝ. පුතාගේ නම මලිත්. දූව මලිති. මලිත් සහ මලිති ඉතා ම හොඳ ගති පැවතුම් ඇති ළමයි දෙදෙනෙක්.අම්මා සමඟ ගමන් බිමන් යන්න මේ දෙන්නා හරිම ආසයි. ඒ යන අතරමඟ දී හමුවන අහල පහල අය සමඟ මොවුන් සුහදව කතා බහ කරනවා.ගමේ හැම දෙනා ම මේ දරුවන් දෙන්නාට හරිම ආදරෙයි. අපේ සිරිත් විරිත්වලට ගරු කරන, දෙමව්පියන්ට කීකරු වී හැදෙන ළමයි දෙන්නෙක් කියලා ගමේ කවුරුත් කතාබහ කළා. මේ දරුවන්ගේ හොඳ ගතිගුණවලට පැහැදුණු සමහර  අය ඔවුන්ට තෑගි බෝග පවා ගෙදරට රැගෙන ගෙදරට ආවා.

එසේ පැමිණි අයට කෑම බීමවලින් සංග්‍රහ කරන්න මේ ගෙදර අය අමතක කළේ නැහැ. මේ දරුවෝ දෙන්නා ඉගෙනීමටත් දක්ෂ යි. පාසලේ බාහිර වැඩ කටයුතුවල දී ද මොවුන් කැපී පෙනෙන අයුරින් කටයුතු කරනවා.

| | |
|---|---|
| ගමන් | බිමන් |
| අහල | පහල |
| සිරිත් | විරිත් |
| තෑගි | බෝග |
| කෑම | බීම |

**<u>යුගල පද යොදා වාක්‍ය ලියමු.</u>**

උදාහරණ :

- අපේ ගෙදර <u>අහල පහල</u> අය හරි හොඳයි.
- අපි අවුරුදු <u>සිරිත් විරිත්</u>වලට ගරු කරමු.

➢ උදාහරණය පොතේ ලියාගෙන ඉහත කොටුව තුළ ඇති යුගල පද පහට වාක්‍ය නිර්මාණය කරන්න.